# ‘පට්ඨාන’ විසිදෙවෙනි දේශනාව (ආසේවන ප්‍රත්‍යය)

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන් ලෝකයට ධර්ම ආලෝකයක්ව පහළ වී වදාළා වූ සියලුම සත්වයන් කෙරෙහි පතලා වූ මහා කරුණා ගුණයක් ඇත්තාවූ ධර්ම ඥානයේ පරතෙරට පැමිණියා වූ ඒ සඳහා අනන්ත අපරිමාණ කාලයක් සංසාරයේ දානාදී දස පාරමී ධර්මයන් මෛත්‍රී සිතින් කරුණා සිතින් කුසල සිතින් දියුණු කලාවූ වඩා ගත්තාවූ දස බලධාරී වූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ පිරිසිඳු සිතෙහි පහළ වූ ධර්ම ස්කන්ධයට උන්වහසේගේ උතුම් වූ නුවණින් අවබෝධ කොට ගත්තාවූ දේශනා කොට වදාළා වූ අති ප්‍රනීත වූ මධුර වූ ශ්‍රී සත් ධර්මස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ප්‍රනීත වූ ධර්ම මාර්ගය අනුගමනය කරමින් සහ ශ්‍රාවක භාවයට පත් උනාවූ අෂ්ට ආර්ය පුද්ගල මහා සංඝ රත්නයට **‘අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස’** යන යනාදී වශයෙන් ලෝකයාගේ අනුත්තර වූ සුවිශේෂ වූ පුණ්‍යයක් ක්ෂේත්‍රය වශයෙන් පිහිටන්නාවූ මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ බුද්ධ රත්නයේ ධර්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත වූ අපරිමාණ වූ කියා නිමක් කර නොහැකි ගුණ සකන්ධයේ ආනුභාව බලයෙන් තුනුරුවන්ගේ අනන්ත ගුණ බලයෙනුත් තුනුරුවන්ගේ ගුණ මොහොතකට හෝ වේවා සිහිපත්කොට වන්දනා කිරීමේ කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙනුත් මේ පින්වත් අසාගෙන සිටින්නාවූ සැම දෙනාම ජීවිත කාලයේදී වඩාගෙන තිබෙන්නාවූ කාමාවචර ආදී කුසල ධර්මයන්ගේ අනන්ත ගුණ බලයෙනුත් අදත් මේ බුදුරජාණන්වහන්සේගේ දේශිත ගම්භීර ධර්ම කොට්ඨාසයක් සිත් වලට ස්පර්ශ කරවල දෙන්ට බලාපොරොත්තු වෙනවා දේශනා මාර්ගයෙන්. මේ කියා දෙන්නාවූ ධර්ම කොටස් හැම කෙනාටම හොඳින් වැටහේවා! අවබෝධ වේවා! තේරුම් ගන්ට ලැබේවා! ඒ සඳහා අවශ්‍ය වන්නාවූ සිහියත් නුවණත් යෝනිසෝ මනසිකාරයත් මතුවේවා! කිසිම බාධකයක් ඇති නොවේවා! මේ උතුම් වූ ශ්‍රී සත්ධර්මය කෙරෙහි ශ්‍රද්ධා ගුණය පිහිටුවාගෙන ප්‍රතිපදාවක් හැටියට මේ ධර්මය අහල ඒ ධර්මය ධර්මයක් හැටියට අවබෝධ කරගනිමින් ඇලීමේ ගතිය බැඳීමේ ගතිය උපාදාන ගතිය කඩාගෙන බිඳගෙන නැති කරගෙන සැමදෙනාටම පරම ශාන්ත වූ නිර්වාණ ධාතුව අවබෝධ කරගන්නට ලැබේවා! කියල අපි මෛත්‍රීයෙන් ආශීර්වාද කරනවා ප්‍රාර්ථනා කරනවා.

අද මේ පිනවත් සැම දෙනාටම අපි මේ පට්ඨාන දේශනා අනුසාරයෙන් ඉදිරිපත් කරලා කියල දෙන්ට බලාපොරොත්තු වෙන්නේ බුදුරජාණන්වහන්සේගේ ඒ සූවිසි පට්ඨානයේ තවත් පට්ඨාන ධර්ම කාරණයක්. මේ දක්වා පිළිවෙලින් අපි සූවිසි ප්‍රත්‍යය ධර්ම කාරණා වලින්

කොටසක් කියල දුන්නා. ඒවාගෙන් උදව්වත් උපකාරයත් ලබාගෙන අපි අද තව කොටසක් හිතල බලමු. ප්‍රත්‍යය ධර්ම 24 තුල ප්‍රත්‍යය ධර්මයක් තිබෙනවා **'ආසේවන ප්‍රත්‍යය'** කියල. **'ආසේවන ප්‍රත්‍යය'** - මේ ප්‍රත්‍යය ධර්මය තුලින් මතකයේ හැටියට බොහොම කාලයකට ඉහතදී මේ ධර්ම මණ්ඩපයට හරි වෙනත් කොහේ හරි දේශනා කරලා තියෙනවා කියල. ඒ උනත් කමක් නෑ මේක අසල තිබෙනවානම් තවත් අවබෝධය වැඩි කරගැනීමට හිතේ පිරිසිදු දැනුමක් තේරුමක් ලබා ගැනීමට මෙය උපකාර වෙනවා. එමනිසා අපි අද **'ආසේවන ප්‍රත්‍යය'** පිළිබඳව කථා කරමු. මේ **'ආසේවන ප්‍රත්‍යය'** ගැන කථා කරන්නට කලින් මම තවත් පොඩි කාරණයකට මේ පින්වතුන්ගේ හිත යොමු කරන්ට කැමතියි.

මේ ලෝකයේ තිබෙන්නාවූ ධර්මස්වභාවයෝ සියල්ලක්ම පවතින්නේ - පිහිටා තිබෙන්නේ එක්තරා විධි තුනකට - ක්‍රම තුනකට. ඒ ක්‍රම තුන බැලුවම ලෝකයේ හැටියට කථා කරන ක්‍රම තුනකට. එකක් තමයි මේ ලෝකයේ තිබෙන්නාවූ දේවල් අපිට මතුවෙලා දිස්වෙනවා ද්‍රව්‍යාත්මකව ද්‍රව්‍යයක් හැටියට. ඒක ධ්‍රැව - ඝන කියල නැහැ ද්‍රව්‍යයක් හැටියට - වස්තුවක් හැටියට ඉදිරිපත් වෙලා පේනවා. ඉදිරිපත් වෙලා මතුවෙනවා - ද්‍රව්‍යාත්මකව යම් යම් දේවල් කථා කරනවා. තවත් තිබෙනවා - යම් කිසි වස්තුවක් ගත්තහම - යම්කිසි ද්‍රව්‍යයක් ගත්තහම - ඒ ද්‍රව්‍යයට බැඳිල - ද්‍රව්‍යයට කැවිලා - ද්‍රව්‍යයේ එක කොටසක් හැටියට තව ගුණයක් තිබෙනවා ඒකට කියනවා 'ගුණ ස්වභාවය' කියල - ඒකට කියනවා 'ගුණය' කියල. ද්‍රව්‍යාත්මකව දේවල් පිහිටලා තියෙනවා - ඒකෙ 'ගුණය' හැටියට පිහිටනවා. තවත් දෙයක් තිබෙනවා මේ ලෝකයේ දේවල් ක්‍රියා මාත්‍රා හැටියට පිහිටා තිබෙනවා. ද්‍රව්‍යය - ගුණ - ක්‍රියා - හැටියට තමයි ලෝකයේ දේවල් තියෙන්නේ. බුදුරජාණන්වහන්සේගේ ධර්මයට ධාතු ස්වභාව කියල කියනවා. අපි ඒකත් තේරුම් ගනිමු. මේ මම කියාපු වචන තුන අපි මේ වෙලාවට හිතට කා වද්දා ගමු - තේරුම් ගනිමු.

අපි හිතමු ගහක් තිබෙනවා කියල. මීටර් 4 ක් විතර උස ගහක් තියෙනවා. ඒ ගහ අපිට පෙන්නේ වස්තුවක් හැටියට යම්කිසි ද්‍රව්‍යාත්මක දෙයක් හැටියටයි. ඒ ගහේ තිබෙනවා ගහ හැදෙන වෙලාවේම ගහත් එක්කම බැඳී තිබෙන ගුණයක්. ඒ තමයි ගහේ මහත - ඒ කියන්නේ ගුණ ස්වභාවයක්. ගහේ උස කියන්නේ තව ගුණ ස්වභාවයක්. ගහේ පළල කියන්නේ ගුණ ස්වභාවයක්. අන්න ඒ විදියට ගහේ තරාතිරම කියනවා. උසයි පළලයි මහතයි දිගයි කොටයි - මෙන්න මේවා ඒ වස්තුව ආශ්‍රය කරගෙන පවතින ගුණයෝ. ගුණ ස්වභාව. ලක්ෂණ සවභාව. මේ ගුණ කියන වචනය අපි ගත්තම තේරුම් ගන්න හොඳ නෑ මෙහෙම - 'බෙහෙතක් බොනවා - ඒකට ගුණ උනා ප්‍රත්‍යය උනා' - ඒ අර්ථයෙන් නෙමෙයි මේක ගන්නේ. කෑම බීම කැවහම ගුණයි. ඒවාගේම අපි ගන්න බෙහෙත් හේත් ඒවගේම යම් යම් දේවල් තියෙනවා - ඒවා අපි ගත්තයින් පස්සේ ගුණයි කියල - ඒක නෙමෙයි. එහෙම ගුණයකුත් තියෙනවා. මෙතන කියන්නේ - **'ගුණය'** - කියල කියන්නේ යම්කිසි වස්තුවක තිබෙන ආකාර විශේෂය. අපි ගමු තව මේසයක්. මේසයක් තිබෙනවා - ඒ මේසය වස්තුවක් හැටියට ද්‍රව්‍යාත්මකව තමයි ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒ මේසයේ තිබෙනවා 'ගුණ' ස්වභාවයක්. ඒ තමයි මේසයේ 'උස' කියල කියන්නේ ගුණයක්. මේසයේ 'පළල' කියල කියන්නේ එක්තරා ගුණයක්. මේසයේ 'ඝනකම' කියල කියන්නේ එක්තරා ගුණයක්. මේසය උසයි කියන්නේ මිටියි කියන්නේ ගුණයක්. මෙන්න මේ උසකම කථා කරන්ට - මිටිකම කථා කරන්ට පුළුවන් කම තියෙන්නේ වස්තුව ආධාර කරගෙනයි. ඉතින් අපි උස

ගැන කථා කරනවා. මිටි කම ගැන කථා කරනවා. පළල ගැන කථා කරනවා. මේ විදියට උස කම - මිටි කම - පළල කම යන මේවා යම්කිසි ආකාරයකට ලෝකයේ තියෙන හින්දයි කියන්නේ - කථා කරන්නේ. එතකොට 'ද්‍රව්‍යාත්මකව' තිබෙනවා 'ගුණාත්මකව' තිබෙනවා.

අනිත් එක තමයි යම්කිසි දෙයක් ක්‍රියාත්මක වෙමින් 'ක්‍රියා' වශයෙන් තිබෙනවා. එතකොට - ගමන් කරනවා - ඉන්නවා - යනවා - නිදාගන්නවා - කනවා - බොනවා - මේවා ඇවිල්ල යම්කිසි ක්‍රියා ස්වභාව මාත්‍ර. ඊටත් වඩා අපි මේ කථා කරන්නාවූ 'හිත' ද්‍රව්‍යාත්මක දෙයක් නෙමෙයි. අපි මේ කථා කරන 'චෛතසික ධර්ම' ද්‍රව්‍යාත්මක දේවල් නෙමෙයි. මේ හිතේ දිගයි කියල දෙයක් පෙන්නන්න බෑ. ද්‍රව්‍යාත්මක නොවෙන නිසා. ඒ හිත උසයි කියල කියන්න බෑ ද්‍රව්‍යාත්මක නොවෙන නිසා. හිත මහතයි - හිත ලොකුයි - හිත කෙට්ටුයි - හිත හීන්දෑරියි කියන්ට බෑ. හේතුව මේ හිත ද්‍රව්‍යයක් නොවන උස මහත දිග පළල දක්වනට බැරි එක්තරා විදියක ක්‍රියා මාත්‍රයක් පමණයි. මේ ක්‍රියා මාත්‍රය ක්‍රියාත්මක වේවී - ක්‍රියාත්මක වේවී මූල ධාතුවක් හැටියට පවතිනවා - ඒක ක්‍රියා මාත්‍රයක්. ඒවගේ ක්‍රියා මාත්‍රා ස්වභාවයෙන් තිබෙන්නාවූ දේවල් ටිකක් ගැන තමයි අපි මේ අභිධර්ම කථාවෙන් මේ කථා කරන්නේ. සූත්‍ර දේශනා වලත් ඔය ධර්මම තමයි - සිත ගැන කිව්වම - ඊළඟට තරහව වෛරය ක්‍රෝධය ඊර්ෂ්‍යාව පළි ගැනීම මාන ආදී දේවල් කිව්වහම ඒවත් ඔය ක්‍රියා ධර්ම තමයි. ලෝකය සම්මුතියේ ගිලගෙන - සම්මුතියේ බැසගෙන - සම්මුතියේ හිටගෙන - සම්මුතියේම නිදාගෙන ඒකෙ ගැලී ඉන්නාවූ කෙනාට ඒකට ගැලපෙන විදියට අත්දැකීම් එක්ක ගලපා තේරුම් ගන්ට පුළුවන් විදයට තේරුම් ගන්න පුළුවන් විදියට සූත්‍ර දේශනා වල මේ ධර්ම විස්තර කරනවා. ඊට වඩා පුංචි කරලා සියුම් කරලා සියුම් ලක්ෂණ ගුණ සවභාවයෝ එහෙම නැත්නම් ක්‍රියා මාත්‍රා - චෛතසික - සිත් - ධර්ම - අභිධර්මයෙහි විස්තර කරනවා. එකම දේ එකම ධර්ම කොට්ඨාසය ස්ථාන දෙකෙක දේශනා කරන්නේ එය ග්‍රහණය කරගන්ට පුළුවන් කෙනාගේ හිතේ හැටියටයි. ඒ කොහෙන් හෝ වේවා ධර්ම අවබෝධ කරගෙන කෙටි ක්‍රමයෙන් හෝ විස්තරාත්මක ක්‍රමයෙන් හෝ ධර්ම අවබෝධ කරගෙන සසර දුකෙන් මිදීම තමයි එකම පරමාර්ථය බුදුරජාණන්වහන්සේගේ දේශනාවේ. ඒක කෙනාගේ හැටියට ඉක්මන් වෙන්න පුළුවන් ඒවාගේම ටිකක් ප්‍රමාද වෙන්න පුළුවන්. ඉතින් මේ සූත්‍ර දේශනා අනුසාරයෙන් හිතන ඒවා යොදා බලා සිහිය නුවණ පවත්වාගෙන යන ගමනේදී මේ කියන්නාවූ චිත්ත චෛතසික ධර්මයන්ගේ ක්‍රියාකාරී ස්වභාවයක් තියෙනවා. මේ ක්‍රම දෙකෙන්ම නිවනට තමයි යොමු කරලා තියෙන්නේ. දැන් මේ හිත් ගැන කථා කරනකොට සමහර හිත් තිබෙනවා බලය ශක්තිය හැඩය වැඩය හොඳට වැඩියි. මේ පින්වතුන් දැකල ඇති වතුර පාරවල්. සමහර වතුර පාරවල් තිබෙනවා පෙන දාගෙන සුළි හදාගෙන සුළි කරකවාගෙන තමයි - කැළඹිච්ච ස්වභාවයකින් තමයි ශබ්දය දාහෙන යන්නේ - වතුර ගලාගෙන යන්නේ. ඒකට අහුඋනාම එහෙම කෙනෙකුට සැර පාරෙහි බලය නිසා - ගලාගෙන යන වේගය වැඩි නිසා එහෙම එගොඩ වෙන්න ලේසියෙන් පුළුවන් කමකුත් නෑ. සමහර වෙලාවට තියෙනවා වතුර පාරවල් නිකං ගලාගෙන යනවා කිසිම කැළඹිල්ලක් නෑ. ගලනවා කියල පෙනෙන්නෙත් නෑ. නිකං වතුර තියෙනවා හැටියට තමයි පෙන්නේ. හැබැයි හෙමිහිට ගලනවා. ඔහොම ස්වභාවයක් තිබෙනවා. අපේ හිත් වලත් තිබෙනවා ඔය වගේ ආකාර විශේෂයක්. සමහර සිත් තිබෙනවා රළ පතර වැඩියි වගේ. පෙන දාගෙන ඒවාගේම සුළි දාගෙන මහා බලයකින් මතුවෙලා දිව යන - හැදෙන සිත් තියෙනවා. සමහර සිත්

තිබෙනවා ඒවාට එච්චර හයියක් හත්තියක් - පෙන දාන්න බුබුළු දාන්න තව දේවල් කරන්න බැ නිකං හෙම්හිට ගලාගෙන යනවා. හෙම්හිට මතු වෙනවා. ඒ හෙම්හිට යන්නේ එහෙම නැත්නම් සවභාවයෙන්ම යන්නේ neutral ගතියෙන් යන්නේ විපාක සිත්. අර කුසල සිත් කියන ඒවා අකුසල් සිත් කියන ඒවා කර්ම භවයක් එකතුකරන නිසා කර්ම භවයක් හදන - ගැට ගහන නිසා - චේතනා ශක්තිය වැඩි නිසා - ඒ සිත්වල සැර පරුෂ භාවය - රැස් කරන ස්වභාවය - කර්ම නිෂ්පාදන සවභාවය - රැළි ගහන සවභාවය වැඩියි. එතකොට මේ කුසල් සිද්ධ වෙන්නේ අකුසල් සිද්ධ වෙන්නේ අපි දැනගෙන ඉගෙන ගෙන තිබෙන්නාවූ ක්‍රමයට සිත් පේලියක් ගත්තහම චිත්ත වීථියක ජවන් හරියේ තමයි මේ වැඩ - රැළි දාන ගතිය සිද්ධ වෙන්නේ.

දැන් චිත්ත වීථියක් ගත්තහම - භවාංග සිත ඔය ස්පර්ශයක් වෙච්ච ගමන්ම නැතිවෙලා යන්නේ ඒක නිකං තාලෙකට - neutral විදියට - මධ්‍යම ප්‍රමාණයට ගලාගෙන යන නිසා ඒක වෙනස් වෙන්න පුළුවන්. ඒක නිසා තමයි චිත්ත වීථියකට හැරෙන්නේ. **භවාංග - භවංග චලන - භවාංග උපච්ඡේද - පංච ද්වාරා වජ්ජන - චක්ඛු විඤ්ඤාණ - සමපටිච්ඡන - සන්තීරණ - වොත්තපන** ආදී දේවල් හැදෙන්නේ. මේවා සමහර ඒවා ක්‍රියා සිත් සමහර ඒවා විපාක සිත්. ඒක නිසා මේ කියාපු සිත් පෙළේ ඒ තරම් වැඩි කර්ම එක්කාසු කරන ගතියක් - රැළි ගහන ගතියක් ඕවා චේවා මොකක්වත් නෑ. අරමුණට අනුකූලව ක්‍රියාත්මක වෙන පොඩි වැඩ කොටසක් ඒ වෙලාවට කරා ඉවරයි. අනාගතයට තියාගන්න ඒවා ඒ හිත්වල නෑ. මේ චිත්ත වීථිය ගලාගෙන ගිහිල්ල එකතු වෙනවා ජවන් හරියට. ඒ ජවන් කියන සිත් හරි අමුතුයි. ඒ ජවන් සිත්වල තිබෙනවා මහා අමුතු තව ගුණ ස්වභාව. ආන්න ඒ ජවන් හිත් හරියේ කෙරෙන්නාවූ ජවන් සිත්වලට අදාල වෙච්ච ධර්ම ලක්ෂණයක් තමයි අද මේ කථාවෙන් කියන්නේ. කුසල් අකුසල් ක්‍රියා. අපි ඔය ටිකත් හිතෙහි දරාගෙන අපි අපේ මාතෘකාව පැත්තට හැරෙමු.

මාතෘකාවේ තිබෙනවා මෙහෙම - **'ආසෙවනපච්චයොති – පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවනපච්චයෙන පච්චයො'** = 'ආසේවන ප්‍රත්‍යය කියල කියන්නේ පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නාවූ කුසල ධර්මයෝ පසුව පසුව පහළවෙන කුසල ධර්මයන්ට ආසේවන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය උපකාර ලබනවා' කියන එකයි.

මේ කථාව තේරුම් ගන්ට අපි මේ **'ආසේවන'** කියන වචනය තේරුම් ගනිමු. **'ආසේවන'** කියල කියන්නේ **'අ'** උපසර්ගය පූර්ව කරගත්ත **'සේවන'** කියන වචනය. මේක තේරුම් ගන්නකොට අපි මතක තියා ගන්ට ඕනෑ - **'ප්‍රත්‍යය ධර්මයක්'** තිබෙනවා **'ප්‍රත්‍යය උපන්න ධර්ම'** කියල ජාතියක් තිබෙනවා - මතක ඇති අපි කිව්වා. ප්‍රත්‍යය ධර්ම කියල කියන්නේ යම්කිසි තවත් එහෙකට උදව්වක් උපකාරයක් දක්වන්ට පුළුවන් ගුණ ස්වභාවය තිබෙන - ධර්ම ස්වභාවය තිබෙන එකට කියනවා **'ප්‍රත්‍යය ධර්ම'** කියල. ඉතින් යම්කිසි දෙයකට අනිත් එහෙකට උපකාර වෙන්ට පුළුවන් ගතියක් තිබෙනවා නම් ඒ උපකාරය ලබන්නාවූ දේකුත් තියෙන්ට ඕනෑ. ඒකට කියනවා - ඒ උපකාරය ලබන එකට කියනවා **'ප්‍රත්‍යය උප්පන්න ධර්ම'** කියල.

අපි පිහියකින් ඇපල් ගෙඩියක් කපනවා. පිහියක් අරගෙන ඇපල් ගෙඩියක් කපන කොට ඒ ඇපල් ගෙඩිය කපන්ට උපකාර වෙන්නේ පිහියයි. එතකොට කපන ගුණය - කැපීමේ ගුණය - කැපීමේ ශක්තිය තිබෙන්නේ පිහියේ. ඒ පිහියෙන් කපනකොට ඒ පිහියෙන් කැපීගෙන යන්නේ ඇපල් ගෙඩිය. පිහිය කියල කියන්නේ ප්‍රත්‍යය උපකාරක ධර්මය - අනිත් එක තමයි - කැපීගෙන යන ධර්මයට කියනවා ප්‍රත්‍යය උපන්න ධර්මය කියල = ඇපල් ගෙඩිය. ඔය විදියට තිබෙනවා ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උපන්න ධර්මය කියල දෙකක්.

දැන්මේ කථාවේදී එනම් **'ආසේවන ප්‍රත්‍යය'** කියල කියන කොට එතනත් තිබෙනවා 'ප්‍රත්‍යය උපන්න ධර්ම'. 'ආසේවනය' කියල කියන්නේ - යම් කිසි දේකට හුරුවක් - ප්‍රගුණ භාවයක් - එවාගේම යම්කිසි ශක්ති ගුණයක් ඇති කරන්නාවූ ගති ස්වභාවයට කියනවා 'ආසේවන උපකාර ප්‍රත්‍යය ගුණය' කියල. අපි මෙහෙම හිතමු - එක්කෙනෙක් පොතක් කියවනවා. පොතක් කියවන කොට ඉස්සෙල්ලාම පිටුවක් කියවනවා. වචන කීපයක් කියවනවා. ඒක ඉස් ඉස්සරවෙලාම කියවන කොට හරි අමාරුයි. නුහුරුයි - නුපුරුදුයි. ඒක නිසාවෙන් පටලැවෙනවා - ඒවාගේම හැප්පෙනවා - ප්‍රගුණ නෑ. එක පාරක් කියල තව වතාවක් ඒ පොත කියවනවා - හැබැයි ඉස්සර වෙලා කියවල ගිය නිසා දෙවෙනි වතාවේ කියන කොට ටිකක් අමුතු පෙළ ගැහීමක් - අමුතු විදියේ ඉස්සරහට යෑමක් - හුරුවක් ඕකේ තියෙනවා. අමතක කරන්ට හොඳ නෑ - ඉස්සරවෙලා කියවපු අවස්ථාවයි පසුව කියවන අවස්ථාවයි කියල කියන්නේ අවස්ථා දෙකක්. ඒ අවස්ථා දෙකෙන් ඉස්සරවෙලා කියවපු අවස්ථාව කියවල ඉවරයි - ඒක අතීතයට ගියා - දැන් නැවත වතාවක් මේක කියවගෙන යනකොට අතීතයට ගියත් අර ඉස්සරවෙලා කියවපු එකේ යම් කිසි ආනුභාව ගතියක් යම්කිසි පෙළ ගස්සන ශක්ති ගතියක් යම්කිසි හුරු කිරීමක් මේ දැන් කියවන තැනට ඇවිල්ල තියෙනවා. එතකොට දැන් ඒකත් අපි හිතමු තුන්වෙනි වතාවට කියවනව කියල. තුන්වෙනි වතාවට කියන කොට දෙවෙනි වතාවටත් වඩා ටිකක් හුරුවට කියවෙනවා. හතර වෙනි අවස්ථාවට කියවනවා. එතකොට තව ටිකක් හුරුවට කියවෙනවා. මෙනන මේ ගතිය - ඒ කියන්නේ සිතක් පහළ උනහම ඒ පහළ වෙච්ච හිතට පසුව හිතක් පහළ වෙනවා. හැම හිතක්ම නෙමෙයි. එම වර්ගයේ හිතක් - ඒ හිත පහළ උනහම ඊළඟට පහළ වෙන්නාවූ හිතට මේ කලින් පහළ උනාවූ හිතේ යම්කිසි ගුණ ගතියක් - යම් කිසි හුරු ගතියක් - යම්කිසි පුරුදු කරන ගතියක් - යම්කිසි ඒත්තු ගන්නන ගතියක් ඒවාගේම බල ගන්නන ගතියක් - ශක්ති ගන්වන ගතියක් තියෙනවා. ආන්න ඒ ශක්ති ගන්වන ගතියට - යම්කිසි දේකට හුරුවක් ගහන ගතියට කියනවා 'ආසේවනය' කරන්නාවූ 'ආසේවන ප්‍රත්‍යය ගුණය' කියල.

දැන් ඕක අපිට හොඳට තේරුම් ගන්න පුළුවන්. ඉස්සරවෙලා කෙනෙක් පොත කියවනවා - පිටුවක් කියවල දෙවෙනි වතාවේ කියවන කොට ටිකක් හුරුවක් පෙළ ගැහීමක් ගැලපීමක් තියෙනවා. එතකොට දෙවෙනි වතාවේ හොඳටම සක් සුදක් සේ පැහැදිලියි එයාට හොඳටම ඒක කියාගෙන යන්න පුළුවන්. තුන්වෙනි වතාවට කියවනකොට තවත් ටිකක් පුළුවන්. ඒ තුන්වෙනි වතාවේ කියවන කොට තවත් ටිකක් පුළුවන් වෙන්නේ ඉස්සරවෙලා කියවපු වාර දෙකේදීම කියපු එකේ හුරුවක් - ගුණයක් - පුරුද්දක් මේ වෙලාවට ගහපු නිසාමයි. වෙන කිසිම දෙයක් නෙමෙයි. ඒකනිසා දැන් හොඳට කියවන්න පුළුවන් කම තියෙන්නේ ඉස්සරවෙලා දෙයින් අපිට හුරුකිරීමක් - ඒත්තු ගැන්වීමක් - බල ගැන්වීමක් මේ කියවන එකට ලබා දීල තියෙනවා. තුන්වෙනි වතාව කියවීම තමයි 'ප්‍රත්‍යය උප්පන්නය'. ඒ 'ප්‍රත්‍යය

උපන්නයට' මුලින් කියාපුදේට තිබිච්ච ශක්තිය ලබා දීම තමයි 'ප්‍රත්‍යය'. ඔය විදියට තමයි අපි පැහැදිලිව මේ ධර්ම කාරණා ටික තේරුම් ගන්ට ඕනේ.

ඊළඟට හැම වෙලාවේම ඒ 'ආසේවන ප්‍රත්‍යය' ලබන්නේ පසුව පසුව පහළ වෙන්නාවූ සිත්. මතක තියා ගත යුතුයි අපි හැම හිතක්ම නෙමෙයි **'ජවන් හිත් පමණයි'**.

තවත් තියෙනවා - අපි කිව්වා විපාක සිත් කියන ඒවා යම් තැන්වල ජවන් හිත හැටියට පහළ වෙනවා කියල. විපාක සිත් කියන ඒවත් යම් යම් තැන් වල ජවන් සිත් හැටියට පහළ වෙනවා. හැබැයි ජවන් හැටියට පහළ උනත් ඒ විපාක සිත් විපාක සිතක් වෙන නිසා ඒකෙ 'ආසේවන ගුණ' ස්වභාවය නෑ. එතකොට දෙවෙනි තෙවෙනි සිත්වලට පණ ගන්වන බල ගන්වන ගතිය තමයි 'ආසේවන ශක්තිය' 'ආසේවන ගුණය'. මේක තියෙන්නේ 'කුසල ජවනයන් තුල' - 'අකුසල ජවනයන් තුල' සහ 'ක්‍රියා ජවනයන් තුල'. එතකොට අපි බලමු මේක වෙන තාලේ. විශේෂයෙන්ම තියෙන්නේ කුසල අකුසල ධර්ම තුල බල ගැන්වෙනවා. අපි මෙහෙම හිතමු.

අපි මෙහෙම හිතමු. කාමාවචර සිතක් හිතමු. අපි මේ දකින දේවල් බලන දේවල් අහන කියන දේවල් කායික ස්පර්ශ රස - මේවා සියල්ලක්ම කාම වස්තු අල්ලාගෙන නේ වැඩ කරන්නේ. දකින හෝ අහන හෝ ස්පර්ශ හෝ මොකක් හරි අරමුණක් සම්බන්ධයෙන් යම් කිසි සිත් වැලක් - සිත් පෙළක් යා යුතුයි. චිත්ත වීථියක් යා යුතුයි ඒක සම්පූර්ණ වෙන්න. ඒ සිත්පෙළ යනකොට පංච ද්වාරික වශයෙන් යනවා එළියට බැහැල යන ඒවා. මනෝ ද්වාරික සිත් වශයෙන් යනවා ඇතුලත කරකව කරකව හිත හිතා ඉන්න ඒවා. මේ සිත් වැල් වල මැද්දාවක තියෙනවා කිව්වනේ කර්ම හදන කුසල් වන අකුසල් වන සිත් ජාතියක් ජවන් සිත් කියල. දැන් අපි යමක් දිහා බලන කොට චිත්ත වීථියක් යනවා ඒ සිත් පේළිය පටන් ගන්නේ **භවාංග සිත - භවාංග චලන - භවාංග උපච්ඡේද සිත - පංච ද්වාරවජ්ජන සිත - චක්ඛු විඤ්ඤාණ සිත - සම්පටිච්ඡන සිත - සන්තීරණ සිත - වොත්තපන සිත** - එතනින් පස්සේ අපි හිතමු ලෝභ සහගත එකක් එනවා කියල අකුසල ජවනයන් - **'සෝමනස්ස සහගත දිට්ඨි ගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත'** ඔන්න ඔතෙන්ට හේත්තුවෙලා ගලාගෙන එනවා. මේ දකින එකක් සම්බන්ධයෙන් - රූපයක් මතුවෙලා - මේ පළවෙනි අකුසල් සිත හත් වතාවක් මේකේ දගලනවා. මේ පේළියට. ඒ හත් වතාව දුවගෙන යන්නේ වැඩ කරන්නේ ජවන් සිතක් හැටියට. දැන් එතැනදී ජවන් වැඩේ කරන්නේ. හිත හැබැයි ලෝභ මූලික පළවෙනි සිත. මෙහෙම යනකොට මේ ජවන් සිතේ තිබෙනවා - පළවෙනි ජවනය අකුසල් - දෙවෙනි ජවනය අකුසල් - තුන්වෙනි ජවනයත් අකුසල් - හතරවෙනි එකත් අකුසල් - පහත් අකුසල් - හයත් අකුසල් - හතත් අකුසල්. ඉතින් එකම හිතනේ ඔය හත් වතාවක් දුවන්නේ. එකම හිතනේ ඔය හත් වතාවක් වැඩ කරන්නේ. මෙන්න මේ හිත ගියාට පස්සේ තව පහළ වෙනවා තදාරම්මණ දෙකක්. එතනින් පස්සේ ඉවරයි. දැන් මෙන්න මේ 'ආසේවන ප්‍රත්‍යය' කියන එක වැඩ කරන්නේ ක්‍රියාත්මක වෙන්නේ අර මුලින් කියපු භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද හරියේ නෙමෙයි. මෙන්න මේ කියන්නාවූ ජවන් හරියේ තමයි ආසේවන වෙන හැකියාව තියෙන්නේ - 'ආසේවන ගුණය'.

දැන් පළවෙනි ජවනය පහළ උනා. පළවෙනි ජවනය පහළ උනහම ඒ පළවෙනි ජවනය අරමුණට අනුකූලව අරමුණ දැනගන්න ගතියක් ඒකට තියෙනවා. දැන් දෙවෙනි ජවනය - ඒකෙන් කරන්නෙත් අර පළවෙනි ජවනය අරමුණු කරපු දේම දැන ගන්න එකයි. දෙවෙනි ජවනයට එනකොට මේ ජවනය පළවෙනි ජවනයෙන් හුරු වෙච්ච හුරු වීමක් දෙවෙනි ජවනයට බලපානවා. දෙවෙනි ජවනයට පළවෙනි ජවනයෙන් යම්කිසි හුරුවක් 'ආසේවන ගුණයක්' එකතු වෙනවා. තුන්වෙනි ජවනය යනවා. තුන්වෙනි ජවනය යනකොට දෙවෙනි ජවනයෙන් යම්කිසි 'ආසේවන ගුණයක්' - හුරු ගුණයක් - ඒත්තු ගන්වන ගුණයක් - අරමුණට පුරුදු කරවන ගුණයක් ඒකට යනව. ඊළඟට තුන්වෙනි ජවනය නතරවෙන කොටම හතරවෙනි එක  පහළ වෙනවා. හතර වෙනි ජවනයට යනකොට තුන්වෙනි ජවනයේ තිබ්ච්ච හුරුව පුරුද්ද තව ටිකක් වැඩි කරලා හතරවෙනි එකට ලබාදෙනවා. දැන් 'ආසේවන ප්‍රත්‍යය' හතරවෙනි එකට යනකොට ටිකක් බරසාර සැරසාර වැඩියි. ඊළඟට පස්වෙනි ජවනයට යනකොට පස්වෙනි ජවනයත් ගන්නව - පස් වෙනි ජවනයට ලබාදෙනවා හතර වෙනි ජවන් සිතේ තිබ්ච්ච අර 'ගුණ' ස්වභාවය 'ආසේවන ප්‍රත්‍යය' ස්වභාවය ආසේවන ශක්ති ස්වභාවය. පස්වෙනි හිත හොඳට තව ටිකක් බලයි.  හය වෙනි ජවන් සිත පහළ වෙනකොට ඒකට පහේ එකේ 'ආසේවන බලය' 'ආසේවන ශක්තිය'  ගහනවා.  දැන් හිත් හයකට ආව. හය වෙනි සිත නැතිවෙලා යනකොට ඒකෙ තිබ්ච්ච හුරුව - පුරුද්ද - බලය හත්වෙනි ජවන් සිතට දෙනවා. දැන් මේ හත්වෙනි ජවන් සිත හොඳටම බලවත්නේ. දැන් බලන්ට මේවගේ හත්වෙනි ජවන් සිතට හයවෙනි එකෙන් හම්බඋනා - හයවෙනි ජවන් සිතට පස්වෙනි එකෙන් හම්බඋනා - පස්වෙනි ජවන් සිතට හතරවෙනි එකෙන් හම්බ උනා - හතරවෙනි ජවන් සිතට තුන්වෙනි එකෙන් හම්බඋනා - තුන්වෙනි ජවන් සිතට දෙවෙනි ජවනෙන් හම්බ උනා දෙවෙනි ජවන් සිතට පළවෙනි ජවනෙන් හම්බ උනා - 'ආසේවන ප්‍රත්‍යය ගුණය'. 'ආසේවන ප්‍රත්‍යය' ලබන සිත් වලට කියනව 'ප්‍රත්‍යය උප්පන්න' සිත් කියල. 'ආසේවන ශක්තිය' ලබාදෙන සිත්වලට කියනවා 'ආසේවන ප්‍රත්‍යය' සිත් කියල. මෙතැනදී එක සිතක් සහ චෛතසික අසරණ වෙනවා. ඒ මොන සිතද? පළවෙනි සිත. පළවෙනි සිතට කලින් පහළ වුනා වොත්තපන කියල ක්‍රියා සිතක්. ඒ වොත්තපන කියන ක්‍රියා සිතයි පළවෙනි ජවන් සිතයි කියන එවා වර්ග දෙකක්. එක වර්ගයේ නෙමෙයි. ජවන් සිත කියල කියන්නේ එතැනදී අකුසල් සිතක්. වොත්තපන සිත කියල කියන්නේ ක්‍රියා සිතක්. සමාන නෑ. චෛතසිකයන්ගේ සංකලනයෙනුත් සමාන නෑ. එතකොට වේදනා වශයෙනුත් සමාන නෑ. ඒක නිසා මේ වොත්තපන සිතට බෑ ඒකෙ තිබෙන්නාවූ හැකියාවක් ගුණයක් ජවනයට වද්දන්න. ඒක නිසා මේ වොත්තපන සිතේ 'ආසේවන ප්‍රත්‍ය ගුණය'  නෑ.  වොත්තපන සිතේ 'ආසේවන ප්‍රත්‍යයවෙන' හැකියා ගුණයක් නෑ. ඒක නිසා පළවෙනි ජවන් සිත 'ආසේවන ප්‍රත්‍යය' ලබන්නේ නෑ. ඊට කලින් ජවනයක් නැනේ. හැබැයි පළවෙනි ජවන් සිතට දෙවෙනි ජවනයට 'ආසේවන ප්‍රත්‍යය ශක්තිය' ලබාදෙන්ට පුළුවන් හැකියාව තියෙනවා. පළවෙනි ජවනයට ප්‍රත්‍යය ශක්තියක් ගන්න හැකියාව නෑ - ගන්න කෙනෙක් නෑ කලියෙන්. හැබැයි දෙවන ජවනයට 'ප්‍රත්‍යය ශක්තිය' දෙන්න පුළුවන් හැකියාව පළවෙනි ජවනයට තියෙනවා. ඒක නිසා පළවෙනි ජවන් සිතට 'ආසේවන ප්‍රත්‍යය ශක්තිය' තියෙන 'ආසේවන ප්‍රත්‍යය ගුණයෙන්' යුක්ත වෙච්ච සිතක්. දෙවෙනි සිත එහෙම නෙමෙයි. දෙවෙනි ජවනය ඇවිල්ල ඒකෙ 'ආසේවන ප්‍රත්‍යය' - දෙකකට වැඩ කරනවා.  පළවෙනි ජවනයෙන් ලබාදීපු හුරුවක් පුරුද්දක් බලගැන්වීමක් පුහුණුවක් ඒක ලබා ගන්නවා  (දෙවෙනි සිත). හේතුව දෙවෙනි සිතට සමානයි පළවෙනි ජවනය. අවස්ථා දෙකයි. දෙවෙනි සිත පහළ වෙනකොට පළවෙනි

ජවන සිත පහළ වෙලා ඉවරයි. ඒක අතීතයට ගිහිල්ල. ඒ උනාට - ඒ අතීතයට ගියාවූ පළවෙනි ජවන් සිතෙන් යම්කිසි ශක්ති ගුණ විශේෂයක් - හුරු කරන ගුණ විශේෂයක් - හුරු කරවන බල විශේෂයක් - ධර්ම විශේෂයක් දෙවෙනි සිතට ලැබී තියෙනවා. ඒක නිසා කලින් හිතෙන් ශක්තිය ලබන්නා හැටියට මේ දෙවෙනි ජවන් සිත 'ප්‍රත්‍යය උප්පන්නයි' - පළවෙනි එකේ ආධාරය උපකාරය ලබන්නා නිසා ඒක 'ප්‍රත්‍යය උපන්නයි'. ඒ 'ප්‍රත්‍යය ශක්තිය' ලබාගෙන දැන් දෙවෙනි සිත පහළ වෙනවා. පළවෙනි සිතට සාපේක්ෂව දෙවෙනි සිත 'ප්‍රත්‍යය උප්පන්නයි'. දැන් දෙවෙනි සිත නැති වී යනවා - දැන් දෙවෙනි ජවන් සිත ඉවරයි. තුන් වෙනි සිත පහළ වෙනවා. තුන් වෙනි සිත පහළ වෙනකොට තුන්වෙනි ජවන් සිතට දෙවෙනි ජවන් සිතෙන් යම්කිසි ශක්තියක් බලයක් හුරුකිරීමක් බලගැන්වීමක් යනවා - 'ආසේවන ප්‍රත්‍යය' ශක්තියක් යනවා. එතකොට බලන්ට දෙවෙනි ජවන් සිතේ තිබුන 'ලබන්නයි' 'දෙවන්නයි' කියන ගතිය. පළවෙනි ජවන් සිතේ දීපු ප්‍රත්‍යය ශක්තිය ලැබුවා. ඒ දෙවෙනි ජවන් සිත තුන්වෙනි ජවන් සිතට තව ශක්තියක් ලබා දුන්න. ඒකනිසා 'දෙන්නයි' 'ලබන්නයි' කියන ගතිය වගේ තමන් 'ආසේවන ප්‍රත්‍යය' ලබන ගතියත් තිබුන. තමන්ගෙන් ආසේවන ප්‍රත්‍යය තුන්වෙනි සිතට ලබාදෙන ගති ස්වභාවයත් ඒකෙ තියෙනවා. තුන්වෙනි සිත ගත්තම ටිකක් බල හයිය වැඩියි. එහෙම වෙන්නේ දෙවෙනි සිතෙනුත් බලයක් ආපු නිසා. 'ආසේවන ප්‍රත්‍යය ශක්තිය' ලබලා තියෙන්නේ. තුන්වෙනි ජවන් සිත පහළ වෙලා. තුන්වෙනි ජවන් සිත පහළ වෙන්නේ දෙවෙනි ජවනයට සාපේක්ෂව 'ප්‍රත්‍යය උපන්නයක්' හැටියට. ඒකියන්නේ ඒක 'ප්‍රත්‍යය උප්පන්නයි'. ඒ තුන්වෙනි ජවනය 'ප්‍රත්‍යය උප්පන්නයි' දෙවෙනි ජවනයට සමානයි. තුන්වෙනි ජවනය නැතිවෙලා යනවා. තුන්වෙනි ජවනය නැතිවෙන්නේ හතර වෙනි ජවනයට ඒකෙන් තව හුරුවක් ඒත්තු ගන්වමින් - ලං කරමින් - විසිකරමින්. එහෙම ගුණ ස්වභාවයක් හතර වෙනි එකට දෙනවා. හතරවෙනි ජවනය තුන්වෙනි ජවනයේ 'ආසේවන ප්‍රත්‍යය ශක්තිය' ලබනවා. ඒක නිසා හතරවෙනි ජවනය 'ප්‍රත්‍යය උප්පන්නයි' තුන්වෙනි එකට සාපේක්ෂව. හතරවෙනි ජවනයත් ඇතිවෙලා නැතිවෙනවා පස් වෙනි එකට ඒකෙ ජවන් 'ආසේවන ශක්තිය' දෙනවා. පස්වෙනි ජවනය 'ආසේවන ප්‍රත්‍යය' ලබනවා - මොකෙන්ද? හතරවෙනි ජවනයෙන්. තුන්වෙනි ජවනයට සාපේක්ෂව හතරවෙනි ජවනය 'ප්‍රත්‍යය උප්පන්නයි'. හැබැයි හතරවෙනි ජවනය 5 වෙනි ජවනයට සාපේක්ෂව ගලපලා බැලුවයින් පස්සේ 'ප්‍රත්‍යයයි'. ඒකියන්නේ 5 වෙනි එකට 'ආසේවන ප්‍රත්‍යය' දෙන්නේ 4රෙන්. දැන් 5 වෙනි ජවනය පහළ වෙනවා. 5 වෙනි ජවනය පහළ වෙනකොට 4 වෙනි ජවනයෙන් ලබාගත්ත ඒ 'ආසේවන ශක්තියක්' ලැබිල ඊට පස්සේ 'ප්‍රත්‍යය උප්පන්න' වෙනවා. දැන් 5 වෙනි ජවනය නැතිවෙලා යනවා 6 වෙනි ජවනයට 'ආසේවන ප්‍රත්‍යයයෙන්' ප්‍රත්‍යය වෙනවා. 6 වෙනි ජවනය යනකොට හොඳට බලවත්වෙලා හයිය වෙලා හැඩ වෙලා - ඒකියන්නේ ආසේවනය වෙන ශක්ති මේ හැම එකකම එක සමාන නෑ. ඒවා එක සමාන නෑ. සිත් වශයෙන් ගත්තම සමානයි. ඔක්කොම ජවන් සිත්. ඔක්කොම සමාන සිත්. බලගැන්වීම් වශයෙන් ඒවාගේ පළවෙනි එකට තිබුනට වඩා ශක්තියක් දෙවෙනි එකට තියෙනවා. දෙවෙනි එකට තිබිච්ච ශක්තියට වඩා ශක්තියක් තුන්වෙනි එකට තියෙනවා. තුන්වෙනි එකට වඩා ශක්තියක් හතරවෙනි එකේ. හතරවෙනි එකට වඩා ශක්තියක් 5හේ. 5වෙනි එකට වඩා ශක්තියක් 6 යේ - 6වෙනි ජවන් සිත නැතිවෙලා යනව - ඒ ජවන් සිතේ තිබිච්ච ශක්තියත් 7 වෙනි ජවනයට වද්දගෙන - විසි කරගෙන - ගසාගෙන බලගන්වාගෙන තමයි ඒ හය වෙනි සිත නැතිවෙන්නේ. හත් වෙනි සිත පහළ වෙනවා. හත්වෙනි ජවන් සිත පහළවෙන කොට - හත් වෙනි ජවනය කියල

කියන්නේ හුරුවක් තිබෙන සිතක්. දැන් මේ හත්වෙනි ජවන් සිතෙහි හරි බල හයියක් තියෙනව. හරි හුරුවක් තියෙනවා. හරි පුරුද්දක් තියෙනවා. දැන් බලන්ට මේ හත්වෙනි ජවන් සිතට කලින් තියෙන්නේ හයවෙනි ජවන් සිත. හත්වෙනි සිතට පස්සේ තිබෙන්නේ තදරාම්මණ සිත් සහ භවාංග සිත්. එතකොට මේ තදරම්මණය ඇවිල්ල ජවන් සිතකට සමාන සිතක් නෙමෙයි. භවාංගයක් පහළ උනොත් භවාංගයත් ජවන් සිතකට සමාන සිතක් නොවෙයි - අසමානයි. ඒකෙ තිබෙන්නාවූ චෛතසික රේගුලාසිත් එක්ක හරි අසමානයි. මම විස්වාස කරනවා මේ පින්වතුන්ට මේ කියල දෙන්නාවූ කථාව තේරෙනවා කියල. චිත්ත චෛතසික ධර්ම කථා කරා. චිත්ත වීථි පිළිබඳව කථා කරා. ඒ එක්කම මේ කියන්නේ ඒකෙ අස්සේ තිබෙන්නාවූ යම් කිසි ගුණ විශේෂ.

තවත් මේ ගැන හිතනවනම් මේ 'ආසේවන ප්‍රත්‍යය' ගැන කියනකොට තව එකක් අපි තේරුම් ගන්ට ඕනේ. අපි හිතමු රෙදි ටිකක් සෝදලා නවල තියල අල්මාරියේ තැන්පත් කරලා තියෙනවා කියල. එක එක රෙදි වලට දාල තියෙනවා සුවඳ වර්ග. අලුත් රෙදි - ඉතින් ඒවා නවල අල්මාරියක තියල තියෙනවා. යම්කිසි රෙද්දක් වස්ත්‍රයක් අපි තේරුම් ගන්නේ ඒකෙ තිබෙන්නාවූ ඝනත්වයෙන් - හැඩයෙන් - මල් වලින් - ඒවාගේම art work වලින් - විස්තර වලින් සහ රෙදි වර්ගයෙන්. ඒ රෙදි ගත්තයින් පස්සේ රෙදි වල තියෙනවා සුවඳ කැවිච්ච ගතියක්. ඒක පාටක් හැටියට කියන්න බෑ. උස මහතක් නෑ. ඒ තිබෙන්නාවූ රෙදිවල සුවඳත් එක එක විදියයි. එතකොට එක එක විදියට තියෙන්නේ. අන්න ඒ වගේ තමයි මේ ජවන් සිත් පේළිය ගත්තම ජවන් සිත් පේළියේ මේ කියන්නාවූ කථාව හරියට අර රෙදි වල තියෙන්නාවූ සුවඳින් රෙදි හඳුන ගන්න යනවා වගේ. සුවඳ කියල කියන්නේ බොහෝම සියුම්නේ. රෙදි වල තැවරී ගෑවී තිබෙන සුවඳින් රෙදි හඳුනා ගන්න වගේ සුවඳේ තිබෙන විවිධත්වය දැන ගන්නවා වගේ අමුතුම අමුතු විශේෂ සියුම් වූ සියුම් වූ ක්‍රියා ධර්ම ස්වභාවයක් තමයි අපි මේකෙන් ගන්න යන්නේ.

අවසානය ජවනය ගැන අපි කථා කරා. අවසාන ජවනයට එන කොට ඒක හොඳට හය වතාවක් පැනගෙන පැනගෙන පැනගෙන පුහුණු වේවී පුහුණු වේවි ආපු ඒ හිතක ශක්තියක් තමයි 7 වෙනි හිතට යන්නේ - 'ආසේවන ප්‍රත්‍යය ශක්තිය'. එතකොට 7 වෙනි හිතෙන් පස්සේ ඒ හත්වෙනි ජවනයට එයාගේ ශක්තිය ලබා දෙන්ට තවත් 'ආසේවන ප්‍රත්‍යය' උපකාරය ලබා දෙන්ට හිතක් නෑ. ඒ කියන්නේ භවාංග හිත ඒ 'ආසේවන ප්‍රත්‍යය' ලබන්නෙත් නෑ තදාරම්මණ හිත ලබන්නේත් නෑ. හේතුව - සමාන නැති නිසා. වේදනා වශයෙන් - චෛතසික සංකලනය වශයෙන් ඒක සමාන නැති නිසා. එතකොට මේ හත්වෙනි ජවනයට 'ආසේවන ප්‍රත්‍යය ශක්තිය' නෑ - හත්වෙනි ජවන් සිතට ආසේවනය වෙන්ට - තවත් එහෙකට හුරුවක් ලබා දෙන්ට පුළුවන් ප්‍රත්‍යය ශක්තිය නෑ. නමුත් ඒකෙ තිබෙනවා හොඳ ප්‍රත්‍යය උප්පන්න ස්වභාවයක්. 6 වෙනි එක ඇවිල්ල බලවත් විදියට හුරුවෙලානේ. පළවෙනි එකයි හත්වෙනි එකයි අමුතුයි. පළවෙනි ජවනයට 'ප්‍රත්‍යය උප්පන්න ශක්තිය' නෑ හැබැයි ඒකට පුළුවන් දෙවෙනි එකට පිහිට වෙන්න පුළුවන්. ඒකට පිහිට වෙන්න කෙනෙක් නෑ. හත්වෙනි ජවනයට පුළුවන් හයවෙනි ජවනයේ පිහිට ලබන්න හැබයි එයාට තවත් කෙනෙකුට පිහිට වෙන්න බෑ. දැන් බලන්ට මේකේ තිබෙන සවභාවය. මෙන්න මේ කියන්නාවූ සවභාවය ඔය චිත්ත වීථියක පේළියට පේළියට පේළියට තියෙනවා. ජවන් සිත්වල තමයි මේක සිද්ධ වෙන්නේ. ජවන් සිත්වලට පමණයි - ඒ කියන්නේ - පසුව පසුව

පහළ වෙන්නාවූ චිත්තය බල ගන්වන බලවත් කරන ශක්තිය තියෙන්නේ ඔය ජවන් සිත් වලට පමණයි. ඒකෙනුත් පළවෙනි පළවෙනි චිත්ත සවභාවයට පමණයි.

එතකොට අපි කිව්වා විපාක සිත්වලට මෙහෙම හැකියාවක් නෑ කියලා. විපාක සිත්වලට හැකියාවක් නැති එකත් අපි පොඩ්ඩක් හිතන්න ඕන. ඇයි එහෙම වෙන්නේ? හේතුව - විපාක සිත කියල කියන්නේ කලින් පහළ වෙලා තිබෙන්නාවූ වෙනත් කුසල හරි අකුසල හරි සිත්වල සහනාධාරයකින් දුවන ඒවානේ. ඒවාට අනාගතයේ හැඩ ගන්වන අනාගතයේ බල ගන්වන හිත් හැටියට පහළ වෙන්න බෑ. මේ තමන් දුවන්නෙත් අනුන්ගේ බලයෙන් - තමන් දුවන්නේ අනුන්ගේ බලයෙන් - තමන් දුවන්නේ කුසල හරි අකුසල හරි කර්ම සිතක බලයෙන්. ඒකනිසා විපාක සිත්වල මේක නෑ. විපාක සිත්වල මේ 'ආසේවන වීමේ' ගති ස්වභාවය පිහිටන්නේ නැහැ. අපි තව ටිකක් ඉස්සරහට බලමු. මෙන්න මෙහෙම කථාවකුත් දැන ගත යුතුයි.

කාමාවචර තියෙනවා සිත් 54 ක්. ඒකෙන් 17 ක් විතර තිබෙනවා කුසල් සිත් වශයෙන්. එතකොට මේ කාමාවචර කුසල් සිත්ටික ගත්තයින් පස්සේ ඒ කාමාවචර කුසල් සිත්වල ජවන් සිතකට පස්සේ පහළ වෙන්නාවූ සිත් වලට තමයි මේ බල ගැන්වීම තියෙන්නේ. හැබැයි ඕකේ තව කාරණයක් තේරුම් ගන්න ඕන. ඒ තමයි සිත්වල තිබෙනවා සමාන ගති කියල එකක්. දැන් ඔය කුසල් සිත් තියෙනවනේ 8 ක්. ඇත්තටම කුසල් සිත් 8 වෙන්න හේතුව මොකක්ද? එකම කියන්නේ පොඩි වචනයක් වෙනස් කරලා. බලන්න මෙහෙම කුසල් සිත් සම්බන්ධයෙන්

**සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල් සිත**
**සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික කුසල් සිත** - පොඩි වචනයක් විතරයි වෙනස් වෙන්නේ. **අසංඛාරික - සසංඛාරික** භාවය - එතකොට අපි බලමු එහි තිබෙන ස්වභාවය - සෝමනස්ස වේදනාව සමානයිනේ - ඒවාගේම සමාන සිත් තිබෙන්නාවූ, වේදනාව වශයෙන් ගත්තම විශේෂයෙන්ම කවදාකවත් සෝමනස්ස සහගත සිතක් උපේක්ෂා සහගත සිතකට ඒත්තු ගන්නන්නේ බල ගන්වන්නේ නෑ.

කවදාවකවත්ම ද්වේශ සහගත සිතක් - ඒ කියන්නේ පටිසය තිබෙන්නාවූ සිතක් සැප වේදනාවක් තියෙන එහෙකට 'ආසේවන ප්‍රත්‍යයයෙන්' 'ප්‍රත්‍යය' වීමක් කරන්නේ නෑ.

මේ සිත් යනකොට වේදනා වශයෙන් සමාන බවක් දක්වනවා. උපේක්ෂා සිත උපේක්ෂා සිතට ආසේවනය වෙනවා - ප්‍රත්‍යය වෙනවා. සෝමනස්ස සහගත සිත සෝමනස්ස සහගත සිතකට ප්‍රත්‍යය වෙනවා. දෝමනස්ස සහගත සිත දෝමනස්ස සහගත සිතකටම ප්‍රත්‍යය වෙනවා.

තව එකක් තිබෙනවා - ඒක එහෙම උනාට ඥාන සම්ප්‍රයුක්ත ස්වභාවය තිබෙනවා නම් - ප්‍රඥා ස්වභාවය තිබෙනවා නම් - ඥානය තිබෙනවා නම් කාමාවචර කුසල් සිතක් රූපා වචර කුසල් සිතකට - ඊට පස්සේ අරූපා වචර කුසල් සිතක් ලෝකෝත්තර කුසල් සිතකට ප්‍රත්‍යය වෙන අවස්ථා තියෙනවා. ඒක සිද්ධ වෙන්නේ ඒ ප්‍රත්‍යය වෙන අවස්ථා තියෙන්නේ ධ්‍යාන වලට පත්වෙන සහ මාර්ග වලට පත්වෙන අවස්ථා වලදී. රූපා වචර කුසලයක් තිබෙනවා නම් ජවන් සිතක් තිබෙනවා නම් ඒක රූපා වචරයටයි අරූපා වචරයටයි 'ආසේවන ප්‍රත්‍යයෙන්' පිහිට වෙන උපකාරවෙන ගුණ ස්වභාවයක් ඒවගේ තියෙනවා.

හැබැයි තව එකක් - මේ කථාව කියන කොට - දැන් ජවන් තියෙනවනේ - ලෝකෝත්තර ජවන් - ඒ කියන්නේ දැන් ඔය මාර්ග චිත්ත වීථි ජවන් හැටියට නේ වැඩ කරන්නේ ඕකෙ නම් වෙනස් වෙලා තිබුනට. ඔය ගෝත්‍ර භූ - මාර්ග - ඵල යන මේවා ඇත්ත වශයෙන්ම ජවන් සිත් ටිකක්. හැබැයි ඒවායේ නම් වෙනස්. අපි එතැනදී ජවන් කියන කථාව කථා කරන්නේ නෑ. ඒකට ප්‍රඥාවට මුල් තැන දීල කථා කරන්නේ. ලෝකෝත්තර කුසල් සිත කියල කියන්නේ මාර්ග සිතක්. ඒ මාර්ග සිත පහළ උනාට පස්සේ ආයෙත් මාර්ග සිතක් පහළ වෙන්නේ නැනේ. සෝවාන් මාර්ගය නම් එක පාරයි ඒක නිසා ඒකෙ 'ආසේවන ප්‍රත්‍යය ගුණය' එනම් තවත් එහෙකට පිහිට වෙන ගතිය මාර්ග සිතේ නෑ. බල ගන්වන්නේ නෑ.

ඵල සිත කියල කියන්නේ - ඒක ඇවිල්ල නිවන් අරමුණු කරාට ඒක විපාක සිතක්. ඔන්න ඔය විදියට තිබෙනවා වේදනාවේ - ඥාන සම්ප්‍රයුක්ත භාවයේ - කාමාවචර - රූපා වචර - අරූපා වචර ඒ සිත්වල තිබෙන්නාවූ ස්වභාවයට අනුකූලව ජවන් සිත්වල තවත් එහෙකට උපකාර වෙන අවස්ථා සහ උපකාර නොවෙන්නාවූ අවස්ථා. අපි මේකත් මේ විදියට දැනගෙන - තේරුම් අරගෙන තව ඩිංගක් හිතල බලමු මෙහෙම. ඒ තමයි - අපි ඉස්සෙල්ල කිව්වා වචනයක්. ඒ තමයි මේ පාලි පාඨය **'පුරිමා පුරිමා කුසලා ධම්මා'** = පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නාවූ කුසල ධර්මයන් කියල කියන්නේ ඔය හය දක්වා තියෙන ජවන් සිත් සහ චෛතසික. ජවන් සිතක් පහළ උනායින් පස්සේ ජවන් සිතේ තිබෙනවා පළවෙනි පළවෙනි ඒවා පස්සේ පස්සේ ඒවට උපකාර වෙනවා. ඒවගේම තමයි **'පුරිමා පුරිමා අකුසලා ධම්මා'** - පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නාවූ අකුසල ධර්මයන් පසුව පසුව පහළ වෙන්නාවූ අකුසල ධර්මයන්ට 'ආසේවන ප්‍රත්‍යයයෙන්' ප්‍රත්‍යය වෙනවා. විපාක ධර්ම අත හැරියත් පස්සේ රහතන්වහන්සේලාගේ තිබෙනවා ක්‍රියා සිත් කියල ජාතියක්. රහතන්වහන්සේලාගේ ක්‍රියා සිතුත් කාමාවචරයි රූපාවචරයි අරූපාවචරයි. මේ රහතන් වහන්සේලාගේ පහළ වෙන්නාවූ මේ ක්‍රියා සිතුත් පසුව පසුව පහළ වෙන්නාවූ (ඒවගේ කුසල අකුසල ස්වභාවය නෑ නමුත් ක්‍රියා මාත්‍ර විතරයි) ඒවාට ඒකාන්තයෙන්ම 'ආසේවන ප්‍රත්‍යයයෙන්' පිහිට වෙන ස්වභාවයක් මේකේ තියෙනවා.

තව එකක් තිබෙනවා - දැන ගත යුතුයි. 'ආසේවන ප්‍රත්‍යය' වෙන්නාවූ ධර්මයෝ. 'ආසේවන ප්‍රත්‍යය' වෙන්නාවූ ධර්මයෝ තමයි ලෞකික ජවන් සිත් ටික සහ ඒවාගේ වැඩ කරන්නාවූ චෛතසික ධර්මයන්. ඒවාගේ පිහිට ආධාර ලබන්නාවූ ධර්මයෝ තමයි පසුව පසුව පහළ වෙන්නාවූ ජවන් සිත් සහ චෛතසික ධර්ම. මෙන්න මේ ටික තමයි අපි මේ වෙලාවේදී මේ පින්වතුන්ට මතක් කරන්නේ. මම හිතනවා විශවාස කරනවා මම මේ කෙටියෙන් මේ වෙලාවේදී මේ පින්වතුන්ට කියල දීපු ටික - මේ 'ආසේවන ප්‍රත්‍යය' මේ පින්වතුන්ට වැටහෙන්ට ඇතියි කියල. මේකේ අමුතු රහසකුත් වගේ පේනවා. දැන් බලන්ට අපිට මේ බාහිර ලෝකයට ගියැන් පස්සේ තියෙනවා 'පුහුණු කරනවා' කියල එකක්. 'පුහුණු කරනවා - පුහුණුවක් ලබා දෙනවා' - ඒ කියන්නේ පුහුණුවක් ලබල දෙන්ට යනවා. පුහුණුව කියල කියන්නේ යම් කිසි දෙයක් එක පාරක් කියනවට නෙමෙයි. එය නැවත නැවත - නැවත නැවත කරවල - කියවල - අස්සවල - ඒක හුරු කරන - ඒක පැලපදියන් කරන - ඒක ස්ථාවර කරන්නාවූ ගතියක් - හයිය හත්තිය - කරන ගතියක් තමයි ඔය පුහුණුව කියල කියන්නේ. එතකොට මෙහෙම පුහුණුවක් කරන්ට පුළුවන් කම තිබෙන්නේ ඉස්සර වෙලා ඉස්සරවෙලා කරලා තිබෙන දේවල් පස්සේ පස්සේ ඒවාට හයිය හත්තිය ගන්වන නිසයි. භාෂාවක් ඉගෙන ගන්න ගියහම එහෙමයි. භාෂාව ඉස්සෙල්ල ඉගෙන ගන්න කොට නුහුරුයි නුපුරුදුයි. පසුව පසුව යනකොට ඔය ඉස්සෙල්ල කියපු දේවල් නිකන් වැක්කෙරෙනවා වගේ ටක් ටක් ගාල එනවා. එහෙම ගතියක් තිබෙනවා. එහෙම ගතියක් නැත්නම් මොකද වෙන්නේ? එහෙම ගතියක් පළවෙනි දේවල් වල පළවෙනි ක්‍රියාවල් වල පිහිට ආධාර උපකාරයෝ ලබන්නේ නැත්නම් පස්සේ ඒවා මොකද වෙන්නේ? හුරු කරන්න බෑ - කෙනෙක් පුහුණු කරන්න බෑ. හැම දාම එහෙනම් එකම තැන - එකම තැන. යම්කිසි දෙයක් ඒත්තු ගන්නන්ට පුලුවන් කම තියෙන්නේ පළමු දේවල් වලින් පිහිටක් ශක්තියක් - ආධාරයක් - හුරුකරන ගතියක් - බල ගන්වන ගතියක් තියෙන නිසයි. ඒක නිසා මම මේ මතක් කරන්නේ මේ පින්වතුන්ට ලෝකයේ තිබෙන දේවල් දිහා බලල ඒ ආශ්‍රයෙනුත් මේක තේරුම් ගන්න පුළුවන්. අපි යම් යම් දේවල් කථා කරනවා යම් යම් ක්‍රියාවල් කරනවා මේවගේ ඉස්සෙල්ල කරලා තියෙන ඒවාට වඩා යම්කිසි හුරු වීමක් පසුව දේවල් වලට තිබෙනවා. ලිවීමේ කලාවත් ඒ වගේ. ඒක කියනවා මෙන්න මෙහෙම උදාහරණයක් - උපමාවක් කියනවා - කොළයක් අරගෙන ඒ කොළේ පාට කරනවා. ඒ කොළේට පාටක් දෙනවා. අපි හිතමු කහ පාට වර්ණය දෙනවා. කහ පාට වර්ණය දුන්නහම - සුදු කොළයක කහ ගෑවහම යන්තම්නේ වදින්නේ. ඒ කහ ගාපු ටිකේ තව වතාවක් කහ පාට layer එකක් ගානවා. එහෙම ගෑවයින් පස්සේ අර පළවෙනි එකට වඩා ටිකක් කහ පාට වැඩි ගතියක් ඔප ගතියක් ඇතිවෙනවා. තව වතාවක් ගානවා. එතකොට තවත් එකක් වැඩි වෙනවා. ගෙවල් හුණු ගාන කොටත් තීන්ත ගාන කොටත් ඔය වගේමයි. ඒවගේම ඔය බිත්ති වල පාට කරනවනේ. ඒ බිත්ති පාට කරනකොට එක layer එකක් ගානවා - තව එකක් ගානවා ඔහොම ඔහොම ගාන කොට පස්සේ ඒකෙ layers වැඩි වෙන කොට පාට වැඩි වෙලා හොඳට දිස්වෙනවා. ඒ අනුසාරයෙන් මේකත් එක වර්ගයේ තිබෙන්නාවූ ධර්ම සවභාව පසුපස ඒවා ගැන පිහිට ශක්තිය ආධාර උපකාර වෙලා ලස්සනට පසුව ඒවා බලවත් වෙනවා - අපේ භවනා ධර්ම මාර්ගයත් ඒවගේ. කලින් කලින් අහල හිතල තිබුන දේවල් වලට හුරුවක් පුරුද්දක් ඇති සිත් තමයි පසු පස පහළ වෙන්නේ. කලින් කලින් අහල තිබුන දේවල් වලට හුරුවක් පුරුද්දක් ඇති හිත් තමයි පසු පසුව පහළ වෙන්නේ.

ලඟින්ම උපකාර වෙන ගතිය තමයි අපි මේ ජවන් පේළියේ ඇඳල තියෙන්නේ. ඊටත් වඩා ඈතින් ඈතින් පස්සේ පස්සේ පහළ වෙන සිත් වල අර අලුතෙන් ලබාපුවගේ හුරුවකුත් පුරුද්දකුත් තියෙනවා. එතකොට මේ පසු පසුව අපිට භාවනාවක් බණ ඇසීමක් වැනි කටයුතු කරගෙන යන්න පුළුවන් කම තියෙන්නේ ඒවගේ ශක්තියක් එකක් ජවන් සිත් හුරුවට හැදිච්ච නිසා.

ඒ නිසා මෙන්න මේ ‘ආසේවන ප්‍රත්‍යය’ ස්වාභවය ඔය ජවන් අස්සේ කැවී බැදී තිබෙන්නාවූ ස්වභාවයක් - ධර්ම ස්වභාවයක් - ගුණ ස්වභාවයක් - ඒක උපකාරක ස්වභාවයක්. මේ සැඟවී තිබෙන්නාවූ මේ ගුණ ස්වභාවය ‘ආසේවන ප්‍රත්‍යය’ ස්වභාවය ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ ප්‍රසන්න වූ සියුම් වූ උතුම් වූ ඒ හිතින් ඒ නාමයෙන් උන්වහන්සේ පිරිසිඳුව පැහැදිලිව දැක අවෝධ කරගත්ත. ඒ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඒ ධර්මය අපිටත් දේශනා කළා. සැරියුත් ස්වාමීන්වහන්සේගේ මාර්ගයෙන් අපිට ඒක ලැබුණ. ඒ නිසා ඒ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන්වහන්සේට අපගේ නමස්කාරය වේවා! ඒ ධර්මය ශ්‍රාවකයන්ගේ මාර්ගයෙන් අපිට ලබා දීපු සාරිපුත්‍ර මහා රහතන්වහන්සේටත් අපගේ නමස්කාරය වේවා! ඒවාගේම ඒ ධර්ම ස්කන්ධයට අපගේ නමස්කාරය වේවා! මේ ‘ධර්ම’ - ‘ධර්ම’ මාත්‍රා පමණයි. මේවා ලෝභ කල යුතු ඒවා නෙමෙයි. අනේ හරි හොඳයි ධර්මය - අනේ හරි වටිනවා කියල ඇලෙන්න ඕනෑ ධර්ම නෙමෙයි. මේවා ධර්ම මාත්‍රා - ධර්ම ස්වභාව. ඒ නිසා මේවායේ ඇලෙන්න හොඳ නෑ. කියන දේ ඇලෙන්නත් හොඳ නෑ. ඒවගේම මේක ධර්මයක් හැටියට පමණක් ක්‍රියා මාත්‍රයක් හැටියට පමණක් - ගුණ විශේෂයක් - ගුණ ස්වභාවයක් - ධාතු ස්වභාවයක් හැටියට පමණක් අවබෝධ කරගෙන ඒ අවබෝධයෙන් නවතිනවා - සත්වයෙක් හැටියට භාර ගන්නේ නෑ - පුද්ගල ආත්ම ඈඳි ඒකට පට්ටල කරන්නේ නෑ. ඒ නිසා මේ දේ තේරුම් අරගෙන මේ හේතු ඵල ධර්ම නැති ඒවාගේම අව්‍යාකෘත ධර්මයක් වෙන ශාන්ත වූ ප්‍රනීත වූ සුන්දර වූ පවිවේක වූ අරමුණු කිසිවක් නැත්තාවූ නිවිච්ච ධර්මයක් වෙන පරම ශාන්ත වූ නිර්වාණ ධාතුව සැමදෙනාටම සුවසේ අවබෝධ වේවා! ඒ සඳහා මේ අද කියල දීපු ධර්මයත් මනසිකාර පැවැත්වීමත් හේතු උපනිශ්‍රය වේවා! කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඔබවහන්සේ පැහැදිලි කරල දීපු කාරණාවන් මත අපි තේරුම් ගත්ත ආසේවන ප්‍රත්‍යය කියන්නේ තමන්ගේ ජාතියට අයිති චිත්තය වඩාත් බලවත් කරන්න තමාගේ ස්වභාවය ගැන්වීමට සමත් ශක්ති විශේෂය ආසේවන ප්‍රත්‍යය හැටියට වගේ තේරුම් ගත්ත. ඒවගේම තේරුම් ගත්ත විදියට සවාමීන්වහන්ස අර අනතුරුව ඉපදෙන චිත්තයට ආසේවන ප්‍රත්‍යයට උපකාරවීමට හැකියාවක් ඇත්තේ මේ ජවන් සිත් වලට පමණයි කියන අර්ථය වගේ තේරුම් ගත්තේ. එතකොට ජවන් නොවෙන අනිකුත් සිත් දුබල නිසයි ඒවාට ඒවාට කලින් හටගත්ත සිතේ ස්වභාවය ගැනීමට හැකියාවක් නැත්තේ කියන කාරණාව. ස්වාමීන්වහන්ස ඒ අනුව ඔබ වහන්සේ පැහැදිලි කරලා දුන්න සෝවාන් ඵල සිත වැනි සිත් ගැන - සෝතාපන්න ඵල සිත ගැන හිතුවොත් එහෙම ඒ ආසේවන ප්‍රත්‍යය නැත්තේ ඒ

සෝතාපන්න ඵල සිත කුසල චිත්තයක් උනත් ඒකට අනතුරුව තවත් ලෝකෝත්තර කුසල සිතක් නූපදින නිසාද? ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ පැහැදිලි කරලා දුන්නා නමුත් ඒ ගැන අපිට නැවතත් පොඩ්ඩක් මතක් කරලා දෙන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - ඒක හොඳයි ඒ විදියට තමයි තියෙන්නේ. ලෝකෝත්තර ස්ථානයේදී කථා කිරීමේදී ලෝකෝත්තර මාර්ග සිත් පෙළේ - චිත්ත වීථියේ කුසල සිත් හැටියට පහළ වෙන්නේ එක සිතයි. මාර්ග සිත විතරයි. ඒක කුසල සිත හැටියට සලකනවා - ලෝකෝත්තර මාර්ග චිත්ත වීථියේ. අනිත් ඒවා නිවන් අරමුණු කරත් ඵල සිත් හැටියට සලකන්නේ. එතකොට මේ මාර්ග සිත සහ ඵල සිත ආසේවන කෘත්‍ය කරන්නේ නෑ. හේතුව ආසේවන කෘත්‍ය කරන්නේ නැත්තේ අර මාර්ග සිත දෙකක් වෙන්නේ නැනේ. මාර්ග සිත්නම් මාර්ග සිතම වෙන්න ඕනේ. ඒක නිසා ලෝකෝත්තර කුසල සිත හැටියට සලකන ඒ සිතට පසුව නැවත මාර්ග සිතක් හැටියට කුසලයක් පහළ වෙන්නේ නැති නිසා ආසේවන ප්‍රත්‍යය කිරීමට ඉදිරිපත් වෙන්නේ නෑ. අනිත් එක තමයි ඵල සිත කියන්නේ විපාක සිතක්නේ. ඒක නිසා විපාක සිත්වල ඒ ගතිය නෑ. ඒක නිසා ඒ මහත්තය කියපු එක තේරුම් ගත්තු එක නිවැරදියි.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි සවාමීන්වහන්ස! දළුවත්ත මහත්මයා අහපු ප්‍රශ්නයටම අදාළ තවත් පොඩ්ඩක් විසදා ගන්නත් හිතෙනවා. ස්වාමීන්වහන්ස දැන් ඇත්තටම මාර්ග චිත්ත වීථියකදී අර තීක්ෂණ ප්‍රඥාවකින් යුක්ත නම් ඒ යෝගියා එතකොට පරිකර්ම කියන හිත ඇතිවෙන්නේ නැති නිසා ඵල සිත් දෙකක් එකකට පස්සේ එකක් වශයෙන් පසුව ඇති වෙන බව මතකයි. එතනදිත් විපාක නිසාම ඒක ආසේවන ප්‍රත්‍යයෙන් අනිත් ඵල සිතට ප්‍රත්‍යය වෙන්නේ නැති බව තේරුම් ගත්ත. ස්වාමීන්වහන්ස මට විශේෂයෙන්ම ප්‍රශ්නය උනේ අවසානයේ ඇත්තටම පැහැදිලි කරා 'මම ප්‍රශ්නයක් තිබෙනවා කියල' දැම්මට පස්සේ පැහැදිලි කරා මේවා චිත්ත වීථියකම ජවන් සිත් විදියටමත් නොවෙයි සාමාන්‍යයෙන් කුසලයක් පුහුණු කරපු කෙනෙකුට ඒක පසු කාලයකදී පුහුණුවක් හැටියට ඒක උපකරවෙලා ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙලා ඒ කුසලය තවත් හොඳින් කරගෙන යාමට ඉඩ සැලසෙනවා කියල. ඒ වාගේම ස්වාමීන්වහන්ස තව ටිකක් පැහැදිලි කරගන්න ඕන අර වසනා කෙලෙස් කියල අපි හුගක් වෙලාවට කියනවා පෙර ජීවිත වල පුරුදු පවා මේ ජීවිතියට එනවා කියල. එතකොට එතනදිත් ආසේවන ප්‍රත්‍යයේ යම් කිසි දීමක් තියෙන නිසාද ස්වාමීන්වහන්ස ඒ වාසනා කෙලෙස් කියන ඒවා එන්නේ කියන එකත් පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - වසනා කෙලෙස් සහ ඒ ආසේවන ප්‍රත්‍යය ස්වභාවය අපි පටලවා ගන්නත් හොඳ නෑ. සමහර වෙලාවට සමහර ගතියක් ඔය තියෙනවා - හේතුව - අපි කථා කරලා තිබෙනවා පුරුද්ද කියන එක. එතකොට ඒක ඇවිල්ල අමුතුම ධර්ම විශේෂයක්. ඒක ඇවිල්ල කෙලෙස් වල තිබෙන්නාවූ පුරුද්දක්. කියන්නේ චෛතසික ධර්මයන්ගෙන් බැස ගත්ත ගැව්ච්ච ස්වභාවයක්. මේ කියන්නේ කුසල් වශයෙන් හෝ අකුසල් වශයෙන් හෝ සමාන වී පවතින්නාවූ සිතකට තවත් සිතකට බැහැගෙන යනකොට ඇතිවෙන්නාවූ යම්කිසි අමුතුම විදියේ සියුම් වෙච්ච ධර්ම ස්වභාවයක්. සාමාන්‍යයෙන් අපි කථා කරනවා ඔය පොඩ්ඩක්

තියෙනවයි කියල සංසාරේ දන් දීපු නිසා - කෙලෙස් බර වෙච්ච ගතිය නිසා - එහෙම එකක් තියෙනවා. දැන් බුදුරජාණන්වහන්සේගේ සර්වඥතාඥානයට සම්බන්ධ වෙච්ච උන්වහන්සේට පහළ වෙන්නේ සිත් - කාමාවචර භූමියේ ක්‍රියා සිත් ටික පහළ වෙනවා බුදුරජාණන්වහන්සේට. එතකොට රහතන්වහන්සේට කාමාවචර භූමියේ ක්‍රියා සිත්ටික පහළ වෙනවා. බුදුරජාණන්වහන්සේගේ ක්‍රියා සිත් වල එනම් කාමාවචර ක්‍රියා සිත් ටික තියෙනවා ඊළඟට රූපා වචර ක්‍රියා සිත්ටික තියෙනවා. අරූපා වචර ක්‍රියා සිත් ටික තියෙනවා. මේවාගේත් තිබෙනවා රහත් හිතේ ක්‍රියා සිත් වල එකින් එකට උපකාර වෙන සහ ආසේවන ගුණය ඇති කරන්නාවූ ගතිය. ඒක නිසා තමයි රහතන්වහන්සේ නමක් පොතක් පතක් පාඩම් කරනකොට එහෙම - අපි හිතමු - රහතන්වහන්සේලාත් ධර්මය පාඩම් කරනවනේ - ලෝකයට අනුකම්පා පිණිස - රහතන්වහන්සේලා සංසාර දුකෙන් එතෙර වෙච්ච බව හැබැව. නමුත් ලෝක අනුකම්පාවෙන් ධර්මය අනිත් අයට පුරුදු කිරීමට පුහුණු කරනවා. හැබැයි රහතන්වහන්සේලා ධර්මය පාඩම් කරන්නේ -ධර්මය ඉගෙන ගන්නේ කුසල් සිතකින් නෙමෙයි. ක්‍රියා සිතකින්. ක්‍රියා සිත ඇතුලේ තිබෙනවා අනිත් එකට උදව් වෙන ආසේවන ප්‍රත්‍යය වෙන්නාවූ ගතිය. ඒකයි ඊළඟට ඔය සංසාරයේ තිබෙන්නාවූ කෙලෙස් හුරුව කියන එකයි එක සමාන උනාට ආකාර දෙවිදියකට තමයි ඇති වෙන්නේ.

බොහොම පින් ස්වාමීන්වහන්ස ඒක හොඳින් තේරුනා. ස්වාමීන්වහන්ස දැන් අපි එකම විදියේ සිත් වලින් නෙමෙයිනේ - විවිධ විදියේ සිත් ඇතිවෙනවා කියන කොට දැන් අර අර්පණා එක්ක තියෙන කොට ස්වාමීන්වහන්ස කාමාවචර අරමුණක ඉඳල ඒ  කාමාවචර කුසල් සිත් වලින් පටන් ගෙන ඊට පස්සේ ගෝත්‍ර භූ වලින් පස්සේ අර්පණා වලට යනකොට එතැනදී එකම විදියේ ජවන් නෙමෙයි වෙනත් විදියේ ජවන් වලට ආසේවන ප්‍රත්‍ය යෙන් ප්‍රත්‍යය වීමක් සිද්ධ වෙනවා කියල තමයි තේරුම් ගත්තේ ස්වාමීන්වහන්ස. ඒක නිවැරදිද?

<u>ස්වාමීන්වහන්සේ</u> - හරි  - ඇත්ත වශයෙන්ම ජවන් සිත් පේළියේ - අපි හිතමු සරලව මෛත්‍රී භාවනාව කරනවයි කියල. මෛත්‍රී භාවනාව කරගෙන යනකොට මෛත්‍රී භාවනාව ඇවිල්ල මූලිකය කාමාවචරයිනේ. කාමාවචර වෙන්නේ සත්ව ආරම්මණයක්නේ තියෙන්නේ. සත්ව ආරම්මණයක් - සත්ව ප්‍රඥප්තියක් අල්ලාගෙන ඒ අරමුණට තමයි සුවපත්වේවා සුවපත්වේවා කියල මේ වැඬේ කාවද්දගෙන යන්නේ. ඕක ගිහිල්ලා වැඩි වෙලා - වැඩි වෙලා චිත්ත වීථියෙන් චිත්ත වීථියට මේ පැතීම  මේ ආශිර්වාදය මේ මෛත්‍රීය හැඩ ගැන්විලා බල ගැන්විලා හැම චිත්ත වීථියක් වීථියක් පාසාම පළවෙනි එකෙන් දෙවෙනි එකට - දෙවෙනි එකෙන් තුන්වෙනි එකට බලගැන්විලා ගිහිල්ල ගිහිල්ල මේක පස්සේ පස්සේ යනකොට තව බලවත් වෙලා බලවත් වෙලා මේක කාමාවචර භූමියේ ඉන්න බැරි - ආරම්මණයත් වෙනස් වෙලා - ආරම්මණයත් සියුම් වෙලා - තවත් නිකන් ප්‍රාථමික ස්ථානයක ඉන්න බැරුව නිකන් ඉහළට එසවිලා යනකොට මායිම තියෙනවා. ඒ කියන්නේ ඒක හරියට කියනවානම් immigration type එකට - immigration වගේ. Immigration තියෙන්නේ රටකින් රටකට ඇතුල් වෙන කොටනේ. ආන්න ඒ වගේ කාමාවචර භූමියෙන් අයින් වෙලා රූපා වචර එහෙම නැත්නම් ධ්‍යාන අර්පණා අවස්ථාවට යනකොට එතනින් හිත යන්නේ භවාංගයකින් කැඩිලා නෙමෙයි. එතනින් යන්නේ චිත්ත වීථියකින් තමයි. කාමාවචර චිත්ත වීථිය කාමාවචරයෙන් පටන්ගෙන රූපා වචරයෙන් කෙලවර වෙන්නේ. රූපා වචර ධ්‍යාන සිතකින් කෙලවර

වෙන්නේ. එතකොට මේ border එකේදී කාමාවචර සිතක් රූපාවචරයකට ප්‍රත්‍යය වෙනවා - ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියල කියන්නේ ඕකයි. අපි හිතමු රූපා වචරයකින් ගිහිල්ල අරූපා වචරයට යනවා කියල. අරූපා වචරයට යනකොටත් ඔය විදියයි - කාමාවචරය වඩාගෙන වඩාගෙන ගිහිල්ල ඊට පස්සේ එතනින් තමයි turning point එක හැදෙන්නේ අරූපා වචරයට. එතකොටත් මේ පළවෙනි ජවන් සිත් ටික අරූපා වචරයට ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ඔය හරිය කියන්නේ ඔය boarder එක තියෙන හින්ද තමයි. මේවා ඇවිල්ල නිෂ්පරියාය දේශනා. නිෂ්පරියාය දේශනා කියල කියන්නේ ආයේ මේ බාගයක් කියල කොටසක් ඉතුරුකරන ඒවා නොවයි - පොඩි කෑල්ලක් තිබෙනවා නම් ඒකත් විස්තර කරලා - පොඩි තිතක් වගේ දෙයක් තියෙනවානම් ඒකත් මෙන්න මේ හරියට මෙහෙමයි කියල විස්තර කරල දෙන එකක්. ඒක නිසා ඔය හරිය තමයි ඔය කියන්නේ. මේ විදියට තේරුම් ගත්තම හොඳයි. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි බොහොම පින්!

<u>දළුවත්ත මහතා</u> - හොඳයි එහෙනම් කල්‍යාණ මිත්‍රයෙනි අදත් අපිට වාසනාව ලැබුන බන්තේ ජිනලංකාරයන් විසින් ඉතාමත්ම සවිස්තරාත්මකව සරලව අපිට තේරුම් ගන්න පුළුවන් විදියට ඒ විශිෂ්ට වූ දේශනාව පැවැත්වුවා. අපේ මට්ටමට ගිහිල්ල අපිට තේරුම් ගන්න පුළුවන් ආකාරයට. ඉතින් ගෞරවණීය ස්වාමීන්වහන්සේට අද දවසේදී අපි සියලු දෙනාම ඉතාමත්ම නිශ්ශබ්දව කුසල් සිතින් ධර්මය ශ්‍රවණය කරමින් සිටියේ - ඒ කුසල් සිතින් යුතුවම අපි සියලුදෙනාම එකතුව ප්‍රාර්ථනා කරමු අපගේ උතුම් කල්‍යාණ මිත්‍ර වූ පූජ්‍ය බන්තේ ජිනාලංන්කාරයන්ට උන්වහන්සේ ප්‍රාර්ථනා කරන බෝධියකින් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගැනීමට උන්වහසේ විසින් කරන මේ ධර්ම දානය පුණ්‍ය ක්‍රියාවත් ධර්මය ශ්‍රවණය කිරීම නිසා අපි ඇති කරගත්තාවූ ඒ සියලුම කුසලයනුත් හේතුවක් වේවා කියල අපි කුසල් සිතින් ප්‍රාර්ථනා කර සිටිමු. ඉතින් ඒ අනුව අපි ඉතාම ගෞරවයෙන් ගෞරවණීය ස්වාමීන්වහන්සේට යොමු වෙනවා ස්වාමීන්වහන්ස අද දවසේදී සාකච්ඡාව නිමා කිරීම පිණිස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි හැම දෙනාටම සැපයක් ශාන්තියක් වේවා! අද අපි මේ කාලය වෙන් කරගෙන බුදුරජාණන්වහන්සේගේ දේශිත ධර්මයේ ගාම්භීර ධර්ම කොට්ඨාසයක එක පුංචි ටිකක් තමයි - පොඩ්ඩක් තමයි මේ අපේ හිත් වලින් ස්පර්ශ කරගන්න මහන්සි ගත්තේ. ඒ සඳහා සැමදෙනාගේම කැප වීම ඕනෑ කම ධර්මච්ඡන්දය කුසලච්ඡන්දය ඇති උනා. අපේ පින්වත් කල්‍යාණ මිත්‍ර පිරිස එක්කාසු උනා. ඒවාගේම සැමදෙනාම අපි මේ කියල දීපු කරුණු තේරුම් ගන්න ඇතෙයි කියල අපි විශවාස කරනවා. සැම දෙනාටම ධර්ම අවබෝධය වේවා! අද මේ ධර්ම සාකච්ඡාව දේශනාව තුලින් උපදවා ගත්ත සියලුම කුසල ධර්මයන්ගේ පුණ්‍යය ධර්මයන්ගේ ආනුභාව බලයෙනුත් තුනුරුවන් සතු අනන්ත ගුණ බලයෙනුත් මේ කල්‍යාණ මිත්‍ර මණ්ඩපයේ ප්‍රධානත්වය අරගෙන කටයුතු කරන පින්වත් ලලිත් දළුවත්ත මහත්මයාට චිරාත් කාලයක් නිදුක් නිරෝගී දිර්ඝායු ශ්‍රී සම්පත් අභිවර්ධනය වේවා! ඒ මහත්මයා ප්‍රර්ථනා කරන සියලු ධර්මය ප්‍රාර්ථනාවල් මුදුන් පමුණුවාගෙන ඒවාගේම ධර්ම මාර්ගයේ ගමන් කොට පතන බෝධියකින් නිවනින් සැනසීම ලැබේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරන අතර ඒ මහත්මයාටත් පවුලේ සැම දෙනාටමත් සැනසිල්ලක් වේවා! ඒවාගේම අපේ මේ

පින්වත් ජයන්ත මහත්මයා ආදී ප්‍රශ්න ඇසූ ඒ පින්වත් මහත්මයාලටත් ඒ වාගේම අසාගෙන සිටියාවූ සැම දෙනාටමත් ශාන්තියක් වේවා! ඒවාගේම කෙලෙස් හඳුනාගෙන ඒවාගේ තිබෙන ආසේවන ප්‍රත්‍යය ගුණ තමන්ගේ මනසිකාරයෙන් වටහාගෙන දැනගෙන නොඇලී නොබැඳී නොගැටී හිත් අයින් කරගෙන හිත් නිදහස් කරගෙන සැමදෙනාටම මේ උතුම් ශාන්ත වූ ධර්‍ම මාර්ගයේ ගමන්කොට අමාමහ නිවනින් සැනසීම ලැබේවා! කියල මෛත්‍රීයෙන් පින්දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.